කලාප අධ්‍යාපන කාර්යාලය - රත්නපුර

බහුවරණ ප්‍රශ්න සංග්‍රහය

විෂය-ව්‍යාපාර හා

ශ්‍රේණිය -

සකස් කළ ගුරුභවතාගේ නම - එම්. ජී.ප්‍රදීපා හේමමාලි

පාසල - ර/ බුළුගහතැන්න විද්‍යාලය

පාඩම - 7 පාඩම

1. ව්‍යාපාර ගනුදෙනු ලෙජර ගිණුම් වල සටහන් කිරීමට පෙර සටහන් කරන්නේ මූලික සටහන් පොත්වල ය. එය හඳුන්වන තවත් නමක් **නොවන්නේ ?**
   1) උපයෝගි පොත්
   2) ලෙජරය
   3) ජ්’නල්
   4) දෛනික පොත්

2. සුළු මුදල් ගනුදෙනු සටහන් කරනු ලබන මූලික සටහන් පොත් වන්නේ ?
   1) මුදල් පොත
   2) පොදු ජ්’නලය
   3) සුළු මුදල් පොත
   4) බැංකු ගිණුම

3. පහත වගුව ඇසුරෙන් පිළිතුරු සපයන්න

| ගණුදෙනු වර්ගය | මූලික සටහන් පොත |
|---|---|
| 1. මුදල් ලැබීම් සහ ගෙවීම් සම්බන්ධ ගනුදෙනු | a) බැංකු ගිණුම |
| 2. වෙළඳ භාණ්ඩ ණයට ගැනීම | b) පොදු ජ'නලය |
| 3. බැංකු ජංගම ගිණුම මඟින් සිදුවන ගනුදෙනු | c) ගැනුම් ජ'නලය |
| 4. වෙළඳ භාණ්ඩ ණයට විකුණුම් | d) මුදල් පොත |
| 5. වෙනත් ගනුදෙනු | e) විකුණුම් ජ'නලය |

මෙම ගනුදෙනු වර්ගය, මූලික සටහන් පොත සමඟ නිවැරැදි ව ගැලපූ විට පිළිතුර වන්නේ ?

1) [ 1- d, 2- c, 3- a, 4-b , 5 -e ]
2) [ 1- d, 2- c, 3- e, 4-b , 5 - a]
3) [ 1- d, 2- c, 3- a, 4-e , 5 - b]
4) [ 1- d, 2- e, 3- c, 4-b , 5 -a ]

4. මූලික සටහන් පොත් පවත්වාගෙන යනු ලැබීම පිළිබඳ **වැරදි ප්‍රකාශය** වන්නේ?

1) ලෙජරය පවත්වා ගැනීම පහසු කිරීම සඳහා ය.
2) ලෙජර ගිණුම් වලට පිටපත් කිරීම අසීරු කාර් යයක් නිසා .
3) ව්‍යාපාරයේ ගිණුම්කරණ දෝෂ හඳුනාගැනීම සඳහා .
4) කාලච්ඡේදයට අයත් එකම ස්වරූපයේ ගනුදෙනු වර්ග කර සටහන් කිරීමටය.

5.ව්‍යාපාරයක් විසින් මූලික සටහන් පොත්වලට අවශ්‍ය කරනු ලබන තොරතුරු ලබා ගන්නේ?

1) ලෙජර ගිණුම් වලින් ය.
2) මූලාශ්‍ර ලේඛන වලින් ය.
3) වාචික ප්‍රකාශ වලින් ය.
4) හිමිකරුන්ගේ මතකයේ ඇති සිද්ධීන් මතය.

6.මූලාශ්‍ර ලේඛනයක් පිළිගත හැකි ලියවිල්ලක් වීමට නම්,

1) අදාළ ගනුදෙනුව සිදුවීම ප්‍රමාණවත් ය.
2) එම ගනුදෙනුව සඳහා ව්‍යාපාරයේ එක් අංශයක් මුල්වීම ප්‍රමාණවත් ය.
3) එම ගනුදෙනුව සම්බන්ධ වගකිව යුතු නිලධාරියා අත්සන් කිරීම ප්‍රමාණවත් ය.
4) ඉහත සියල්ලම සමඟ ගනුදෙනුව සම්බන්ධ සියලු විස්තර ඇතුළත් කළ යුතුය.

7.මූලාශ්‍ර ලේඛනයක ඇතුළත් විය යුතු **නොවන්නේ ?**

1) ව්‍යාපාරයේ නම හා ලිපිනය
2) ගනුදෙනුවේ වටිනාකම
3) ගනුදෙනුව සිදු වූ දිනය
4) සෑම විටම අයිතිකරු අත්සන් කල යුතුය.

8.බැංකු ගිණුම මූලික සටහන් පොතක් ලෙස ඊට අවශ්‍ය තොරතුරු ලබා ගන්නා මූලාශ්‍ර ලේඛනයක් **නොවන්නේ ?**

1) අගරු චෙක්පත් දැනුම් දීමේ නිවේදනය
2) බැංකු ප්‍රකාශය
3) ලදුපත්
4) තැන්පත් කිරීමේ කුවිතාන්සි හා ගෙවීම් වවුචර්

9.පහත වගුවේ මූලික සටහන් පොතට අදාළ මූලාශ්‍ර ලේඛනයට යා කරන්න.

| මූලික සටහන් පොත | මූලාශ්‍ර ලේඛනය |
|---|---|
| A. මුදල් පොත | I. විකුණුම් ඉන්වොයිසිය |
| B. ගැනුම් ජනලය | II. ජ්'නල් වවුචරය |
| C. විකුණුම් ජනලය | III. ගැනුම් ඉන්වොයිසිය |
| D. සුලු මුදල් පොත | IV. ලදුපත් , ගෙවීම් වවුචර් |
| E. පොදු ජ්'නලය | V. සුළු මුදල් ගෙවීම් වවුචර් |

1) [ A- I, B,- III, C- IV, D- V, E- II]
2) [ A- IV B,- III, C- I, D- V, E- II]
3) [ A- IV, B,- III, C- II, D- V, E- I]
4) [ A- I, B,- III, C- IV, D- II, E- V]

10.මූලාශ්‍ර ලේඛන වල ප්‍රයෝජනයක් **නොවන්නේ**

1) ගනුදෙනුවට අදාළ ආරම්භක ලියවිල්ලක් ලෙස යොදා ගත හැකිය
2) වගකිව යුතු නිළධාරියෙක් අත්සන් කිරීම අවශ්‍ය නොවන නිසා වගකීම භාරගන්නා භාර ගන්නා පුද්ගලයෙක් නොමැත
3) ගනුදෙනුව පිළිබඳ අතිරේක විස්තර ලබා ගත හැකි වීම .
4) ගණුදෙනුව සනාථ කිරීම සඳහා ලිඛිත සාක්ෂියක් ලෙස භාවිත කළ හැකි වීම

**පිළිතුරු පත්‍රිකාව**

| ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය |
|---|---|---|---|
| 1 | 2 | 6 | 4 |
| 2 | 3 | 7 | 4 |
| 3 | 3 | 8 | 3 |
| 4 | 2 | 9 | 2 |
| 5 | 2 | 10 | 2 |